# අධ්‍යාපන අමාත්‍යාංශය
# கல்வி அமைச்சு
# Ministry of Education

'ඉසුරුපාය', බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
'இசுருபாய', பத்தரமுல்ல, இலங்கை.
'Isurupaya', Battaramulla, Sri Lanka.
+94112785141-50 +94112785818
info@moe.gov.lk www.moe.gov.lk


මගේ යොමුව / எனது இல. / My Ref. ED/1/1/3/2 - i

ඔබේ යොමුව / உமது இல. / Your Ref.

දිනය / திகதி / Date 2023.03.17

චක්‍රලේඛ අංකය - 11/2023

සියලු ම පළාත් අධ්‍යාපන ලේකම්වරුන්,
සියලු ම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
සියලු ම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
සියලු ම කොට්ඨාස භාර නි.අ.අ./ස.අ.අ.වරුන්,
සියලු ම පරිවේණාධිපති හිමිවරුන්,
සියලු ම රජයේ පාසල්වල විදුහල්පතිවරුන්,
රජය අනුමත පෞද්ගලික පාසල්වල විදුහල්පතිවරුන්,
ජාත්‍යන්තර පාසල් සහ පෞද්ගලික පාසල්වල විදුහල්පතිවරුන් වෙත.

## සමස්ත ලංකා පාසල් සංගීත තරගය - 2023

අධ්‍යාපන අමාත්‍යාංශයේ මෙහෙයවීමෙන් වාර්ෂිකව පැවැත්වෙන උක්ත තරගයට අදාළව නිකුත් කරනු ලබන මෙම චක්‍රලේඛය ප්‍රකාරව, ඔබ පළාතේ / කලාපයේ / කොට්ඨාසයේ / විදුහලේ, අදාළ ගුරු භවතුන් සහ ශිෂ්‍ය / ශිෂ්‍යාවන් දැනුවත් කර, ඔවුන්ගේ නිර්මාණ ඉදිරිපත් කිරීමට අදාළ කටයුතු සිදු කරන ලෙස දන්වමි.

රජයේ පාසල් (පිරිවෙන් විද්‍යායතන ද ඇතුළත්ව), රජයේ අනුමත පෞද්ගලික පාසල්වලට මෙම තරග සඳහා සහභාගී විය හැකිය. **එමෙන්ම ,**

- විශේෂයෙන් සඳහන් කර ඇති තරග ශීර්ෂ යටතේ පමණක් රජයේ නොවන පාසල්වලට ද, එනම් ජාත්‍යන්තර පාසල් සහ එවැනි වෙනත් පෞද්ගලික පාසල්වලට ද මෙම තරගයට ඉදිරිපත් වීමට අවස්ථාව සලසා දී තිබේ.

**<u>තරගය පිළිබඳ පොදු නීති රීති</u>**

1.01. සහභාගීවන තරගකරුවන් ප්‍රධාන කොටස් පහකට බෙදේ.

A. කනිෂ්ඨ කොටස - 6 සිට 8 ශ්‍රේණිය දක්වා
B. ජ්‍යෙෂ්ඨ 1 කොටස - 9 සිට 11 ශ්‍රේණිය දක්වා
C. ජ්‍යෙෂ්ඨ 2 කොටස - 12 සිට 13 ශ්‍රේණිය දක්වා
D. විවෘත කොටස - 6 සිට 13 ශ්‍රේණිය දක්වා
E. විශේෂ කොටස - 9 සිට 13 ශ්‍රේණිය දක්වා

1.02. ඉහත කොටස් යටතේ මෙම තරගය පහත සඳහන් පරිදි අංශ පහකට බෙදා ඇත.

1. ගායන අංශය 2. වාදන අංශය 3. නාට්‍ය සංගීත අංශය
4. ස්වර සාධනා අංශය 5. පරිගණක සංගීත අංශය

1.03. ඉහත අංශ ඒකල සහ සමූහ වශයෙන් වඩාත් සුවිශේෂීව බෙදේ.

1.04. යම් තරග ශීර්ෂ කාණ්ඩයක් ගැහැණු , පිරිමි හා මිශ්‍ර ලෙස අවම වශයෙන් ශීර්ෂ එකකින් හෝ උපරිම වශයෙන් ශීර්ෂ නවයකින් සමන්විත විය හැකිය.

1.05. මෙහි ඒ ඒ තරග ශීර්ෂයන් ඉහත 1.01 හි සඳහන් කොටස් සඳහා වන ඉංග්‍රීසි අක්ෂරයකින් සහ ඉලක්කම් ස්ථාන දෙකකින් ද යුක්තවේ. එය පහත ආකාරයට ගොඩනැගේ.

<u>ඉංග්‍රීසි අක්ෂරය</u> :- A. කනිෂ්ඨ කොටස B. ජ්‍යෙෂ්ඨ 1 කොටස C. ජ්‍යෙෂ්ඨ 2 කොටස D. විවෘත කොටස E. විශේෂ කොටස

<u>පළමු අංකය</u> :- 1. ගායන 2. වාදන 3. නාට්‍ය සංගීත 4. ස්වර සාධනා 5. පරිගණක සංගීත

<u>දෙවන අංකය</u> :- ඒ ඒ ශීර්ෂයන්ට අනුව අනුක්‍රමිකව වෙනස් වේ.

1.06. සෑම විටම තරග ශීර්ෂවලට අදාළ කොන්දේසි පෙළ ගස්වා ඇත්තේ අදාළ ශීර්ෂවලට පසුව බැවින්, යම් තරග කොන්දේසියක් අදාළ වන්නේ ඊට ඉහළින් දක්වා ඇති තරග ශීර්ෂයට හෝ ශීර්ෂවලටය.

## <u>02. සහභාගීත්වය</u>

2.01 ශිෂ්‍ය සංඛ්‍යාව 300 ට අඩු, 301 -1000 ත් අතර සහ 1001 ට වැඩි වශයෙන් සිටින පාසල් සඳහා සහභාගී විය හැකි තරග ශීර්ෂ මෙම චක්‍රලේඛයේ නිර්දේශ කර ඇත. අදාළ තරග ශීර්ෂ යටතේ එම කොන්දේසි සඳහන් කර ඇත. එලෙස ශිෂ්‍ය සංඛ්‍යාව අනුව පාසල් වර්ගකර හෝ ශිෂ්‍ය සංඛ්‍යාව අනුව පාසල් හා සම්බන්ධ කොන්දේසි සඳහන් කර නොමැති තරග ශීර්ෂ සඳහා ඉහත කී ඕනෑම පාසලකට ඉදිරිපත් විය හැකිය. විදුහල්පතිවරුන් විසින් තම පාසලේ ශිෂ්‍ය සංඛ්‍යාව අයදුම් පතෙහි සඳහන් කර සහතික කළ යුතු ය. එක් පාසලකට ඉදිරිපත් විය හැක්කේ උපරිම තරග ශීර්ෂ සංඛ්‍යාව **හතරක්** (04) සඳහා පමණකි. **ජාත්‍යන්තර පාසල් සහ එවැනි වෙනත් පෞද්ගලික පාසල්වලට ඉදිරිපත් විය හැකි වන්නේ ඒ සඳහා වෙන් කරන ලද තරග ශීර්ෂ සඳහා පමණි.**

2.02 **<u>එක් පාසලකට සහභාගී විය හැකි තරග ශීර්ෂ තෝරාගැනීමේ ක්‍රමය.</u>**

මෙවර තරගයේ දී එක් පාසලකට සහභාගී විය හැකි උපරිම තරග ශීර්ෂ සංඛ්‍යාව හතරකි. (04) අවම ශීර්ෂ සංඛ්‍යාව එකකි. (01) එහිදී පාසලේ අභිමතය පරිදි ,

තරග ශීර්ෂ එකකට හෝ

තරග ශීර්ෂ දෙකකට හෝ

තරග ශීර්ෂ තුනකට හෝ

තරග ශීර්ෂ හතරටම හෝ

සහභාගී විය හැකි අතර එම තරග ශීර්ෂ පහත ආකාරයට තෝරා ගත යුතුය.

<table>
<tr><td rowspan="5">A , B , C, D<br>කොටස්<br>හතරෙන්<br>උපරිම<br>තරග ශීර්ෂ<br>තුනක් පමණකි<br>(ශීර්ෂ අංක<br>A.1.1. සිට D.3.3<br>දක්වා )</td><td rowspan="5"></td><td colspan="2">තරග ශීර්ෂ තෝරා ගත හැකි ආකාරය</td></tr>
<tr><td>A</td><td>කනිෂ්ඨ කොටස</td><td rowspan="4">ඒකල තරග 01 ක් පමණක්<br>ඒකල තරග 02 ක් පමණක්<br>ඒකල තරග 03 ක් පමණක්<br>සමූහ තරග 01 ක් පමණක්<br>සමූහ තරග 01 ක් සහ ඒකල තරග 01 ක් පමණක්<br>සමූහ තරග 01 ක් සහ ඒකල තරග 02 ක් පමණක්</td></tr>
<tr><td>B</td><td>ජ්‍යෙෂ්ඨ-1කොටස</td></tr>
<tr><td>C</td><td>ජ්‍යෙෂ්ඨ -2 කොටස</td></tr>
<tr><td>D</td><td>විවෘත කොටස</td></tr>
<tr><td colspan="4">සහ, අවශ්‍ය වේනම් ඊට අමතර වශයෙන්</td></tr>
<tr><td>E කොටසින්<br>එක් තරග<br>ශීර්ෂයක්<br>පමණකි<br>(ශීර්ෂ අංක<br>E.1.72 සිට<br>E.5.1දක්වා )</td><td>(E)</td><td>විශේෂ කොටස</td><td>එක් තරග ශීර්ෂයක් (01) ද පමණක් වන ලෙසය.</td></tr>
</table>

2.03 මෙම තරගයට යම් පාසලක 6 ශ්‍රේණියේ සිට 13 ශ්‍රේණිය දක්වා සිසුන්ට සහභාගී වීමට හැකි අතර, විදුහල මගින් දෙවනවර උසස් පෙළ හෝ සාමාන්‍ය පෙළ හෝ විභාගය සඳහා, තරගය පවත්වනු ලබන වර්ෂයේ පෙනී සිටින සිසු සිසුවියන්ට ද සහභාගී විය හැකිය. එහිදී කලාප මට්ටමින් තරග අයදුම්පත් කැඳවන අවස්ථාව වනවිට දෙවනවර පාසල මගින් විභාගයට පෙනී සිට විභාග ප්‍රතිඵල ලබා ඇති සිසුනට මෙම තරගය සඳහා ඉදිරිපත් වීමට නොහැකිය. යම් හෙයකින් කලාප හෝ පළාත් හෝ තරගයට ඉදිරිපත් වී ඇති සිසුවකු තරගාවලිය නිම වීමට පෙර පාසලෙන් අස්වීම් සහතිකය ලබා ඇතිවිටක වුවද ඉදිරි තරග අවස්ථා සඳහා ඉදිරිපත් වීමට විශේෂ අවස්ථාව හිමිවේ.

2.04 අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්ගේ / පළාත් අධ්‍යාපන ලේකම්ගේ / පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරයාගේ / කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරයාගේ/ පළාත් සෞන්දර්ය හෝ සංගීත විෂය භාර අධ්‍යක්ෂවරයාගේ අනුමැතිය ඇතිව, යම් පාසලකට එය අයත් වන පළාතේම වෙනත් පාසලක සංගීත ගුරුභවතුන් හෝ සිසු සිසුවියන් හෝ **සහාය වාදනය** සඳහා සහභාගි කර ගත හැකිය. එහිදී අදාළ විදුහල්පතිවරුන්ගේ අනුමැතිය ලබාගත යුතු ය.

2.05 **සහාය වාදනය සඳහා, ගුරු භවතුන් සහභාගී වන්නේ නම්, උපරිමය ගුරුවරුන් 02 කට සීමා විය යුතුය.**(රජයෙන් පත් කළ ගුරු සහායකයින් , සංවර්ධන නිලධාරීන් සහ සංවර්ධන සහකාර සේවයේ යෙදෙන්නන් ද මෙම තරගයට ඉදිරිපත් වන ගුරු වර්ගයෙහි ලා සලකනු ලැබේ.)

එමෙන්ම , තරගයට ඉදිරිපත් වන පාසලෙහි සේවයේ යෙදී සිටින , රජයෙන් පත් කළ ගුරු සහායකයින් , සංවර්ධන නිලධාරී සහ සංවර්ධන සහකාර වරුන්ට තමා සේවයෙහි යෙදී සිටින පාසල සඳහා පමණක් සහාය වාදනයෙන් සහභාගී වීමට මෙවර තරගයෙහි දී, අවස්ථාව හිමිවේ. එසේ වුවද **ඔවුනට වෙනත් පාසලකට සහාය වාදනයෙන් ඉදිරිපත් වීමට අවස්ථාව හිමි නොවේ.**

2.06 සහාය වාදනය සඳහා සම්බන්ධ වන සිසු සිසුවියන්ට, ඔවුන් සහභාගී වන තරග ශීර්ෂයට නියමිත වයස් සීමාවන් අදාළ නොවේ. සහාය වාදනය සඳහා 6 ශ්‍රේණියේ සිට 13 ශ්‍රේණිය දක්වා ඉගෙනුම ලබන සිසු සිසුවියන්ට ඉදිරිපත් විය හැකිය. එමෙන්ම ගැහැණු /පිරිමි ලෙස වර්ගීකරණයට ලක් නොවේ. **වාදනයෙන් සහාය වන්නන්ට එම ශීර්ෂයට ගායනයෙන් සහාය වීමට නොහැකිය.**

2.07 රජයේ නොවන පාසල්වලට, එනම් ජාත්‍යන්තර පාසල් සහ එවැනි වෙනත් පෞද්ගලික පාසල්වලට , රජයේ පාසලක/ පිරිවෙනක /රජයේ අනුමත පෞද්ගලික පාසල්වල ගුරු භවතුන් හෝ සිසු සිසුවියන් හෝ සහාය වාදනය සඳහා යොදා ගත හැකි වුවත්, රජයේ පාසලකට/ පිරිවෙනකට/රජයේ අනුමත පෞද්ගලික පාසලකට ජාත්‍යන්තර පාසල් සහ එවැනි වෙනත් පෞද්ගලික පාසලක ගුරු භවතුන් සහ සිසු සිසුවියන් සහාය වාදනය සඳහා යොදවා ගත නොහැකිය. එමෙන්ම ජාත්‍යන්තර පාසල් සහ එවැනි වෙනත් පෞද්ගලික පාසල්වල ගුරු භවතුන් හෝ සිසු සිසුවියන් එම පාසල් අතර පමණක් සහාය වාදනය සඳහා යොදවා ගත හැකිය.

**2.08 තබ්ලා වාදනයෙන් සහාය දැක්වීම හා සම්බන්ධයෙන් පහත කරුණ පිළිපැදිය යුතු ය.**

**B.1.25 , B.1.26 , B.1.27 , B.1.28 , B.1.29 , B.1.30, C.1.46 , C.1.47 , C.1.48 , C.1.49 , C.1.50 , C.1.51** යන තරග ශීර්ෂ සඳහා තබ්ලා සහාය වාදනයට සහභාගී විය යුත්තේ තම පාසලේ හෝ පාසල අයත් පළාත තුළ පාසල්හි සිසු සිසුවියන් පමණි. (මෙම තීරණය ගෙන ඇත්තේ පාසල් සිසුන් තුළ තබ්ලා වාදන කුසලතා ද ප්‍රවර්ධනය කිරීමේ අධ්‍යාපනික අවශ්‍යතාව පෙරදැරි කරගෙනය.)

2.09 කිසියම් තරගකරුවකු කලාප තරගයට අයදුම්පත් ඉදිරිපත් කරන අවස්ථාවේ දී ඉගෙනුම ලබමින් සිටි ශ්‍රේණිය යටතේ ම සමස්ත ලංකා අවසාන තරගය දක්වාම ඉදිරිපත් වීමට සුදුසුකම් ලබයි. එමෙන්ම වෙනත් පාසලකට ඇතුළත් වූ සිසු සිසුවියන්ට කලාප තරගයට අයදුම් කරන අවස්ථාවේ ඉගෙනුම ලබමින් සිටි පාසල නියෝජනය කරමින් අවසාන තරගය දක්වා සහභාගී විය හැකිය.

2.10 මෙම වර්ෂයේ දී එකම සිසුවකුට හෝ සිසුවියකට තරග ශිර්ෂ A.1.1. සිට **D.3.3** දක්වා කොටසෙහි ඇතුළත් ඒකල තරග ශිර්ෂ එකකට වඩා ඉදිරිපත් විය නොහැකිය. ඒකල තරගයකට සහභාගී වන සිසුවකුට / සිසුවියකට සමූහ තරග ශිර්ෂයකට ඉදිරිපත්වීමට හැකියාව ඇත.

2.11 **පසුගිය වසරේ (2022) ඒකල තරග ශීර්ෂවලින් ප්‍රථම ස්ථාන ලබාගත් සිසු සිසුවියන්ට මෙවර තරගයෙහි ඒකල තරග ශීර්ෂවලට ඉදිරිපත්විය නොහැකිය. එහෙත් සහාය වාදනයට සහ සමූහ තරග ශීර්ෂ සඳහා සහභාගීවීමට ඔවුනට අවස්ථාව ඇත.**

2.12 ‘‘සමූහ - මිශ්‍ර’’ ගායනා තරගවලදී ගායනය සඳහා සහභාගී වන ශිෂ්‍යයන් හා ශිෂ්‍යාවන්ගේ සංයුතිය එක් වර්ගයකින් 4 දෙනෙකුට වඩා නො අඩු විය යුතු ය.

2.13 තරගය සඳහා යොදාගැනෙන ගී පදමාලා ආදිය ජාති, ආගම්, කුල භේදවලට හෝ පටු දේශපාලනික අදහස්වලට තුඩු නොදෙන, එවැනි අදහස් ගම්‍ය නොවන, සිසුන්ට උචිත ඒවා විය යුතු ය.

2.14 පළාත් නිලධාරීන් විසින් ඉදිරිපත්කළ යෝජනා අනුව තරග අවස්ථාවන්හිදී සුවිශේෂී ඇඳුම් ආයිත්තම් වලින් තරගයට ඉදිරිපත් වීම නොකළ යුතු අතර පාසල් නිල ඇඳුමෙන් සැරසී සිටිය යුතු ය. එසේ නමුත් **D.3.1 , D.3.2** සහ **D.3.3** යන තරග ශීර්ෂ සඳහා **<u>අවසාන තරග අවස්ථාවේදී පමණක්</u>** උචිත ප්‍රාසංගික ඇඳුම් පැළඳුම්වලින් සැරසී ඉදිරිපත් විය හැකිය. එම ඇඳුම් පැළඳුම් පාසල් පද්ධතියට උචිත හා සංවරශීලී ඒවා විය යුතු අතර, ඒ පිළිබඳ පූර්ණ වගකීම අදාළ විදුහලේ විදුහල්පති හා විෂය භාර / කණ්ඩායම භාර ගුරු භවතුන් සතුවේ.

2.15 කිසිදු තරග ශීර්ෂයක් සඳහා වේදිකා පසුතල නිර්මාණ, අලංකරණ උපාංග, සැරසිලි හා නිර්මාණාත්මක උපාංග කිසිවක් භාවිත නොකළ යුතු ය.

2.16 අවසාන තරග කාල සටහනෙහි, අදාළ ශීර්ෂයන්ට වෙන් කර ඇති කාල සීමාව තුළ දී සහභාගි නොවන පාසල්, එම ශීර්ෂයට ඉදිරිපත් නොවන්නා සේ සලකා ප්‍රතිඵල ලබා දීම සිදුවේ.

2.17 තරගයට ඉදිරිපත් වීම සඳහා වේදිකා ගත වූ පසු සංගීත භාණ්ඩ ආදිය සුසර කිරීමට විනාඩි 02 කට වැඩි කාලයක් නොගත යුතු වේ.

2.18 කලාප ,පළාත් සහ අවසාන තරග අවස්ථාවන්ට සහභාගී වීමේදී සහ පුහුණු කටයුතු වලදී එම කාල සීමාව තුළ රටෙහි පවතින සෞඛ්‍ය මාර්ගෝපදේශ අනුගමනය කිරීමට වගබලා ගත යුතු ය.

## 03. තරගයට ඉදිරිපත්වීම

3.01 පළමු තරග අවස්ථාව වන කලාප තරගය සඳහා චක්‍රලේඛ ගත ආදර්ශ අයදුම්පත අනුව ඉල්ලුම් පත්‍රය පුරවා අදාළ කලාපයේ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත ඉදිරිපත්කළ යුතුය. මේ සම්බන්ධයෙන් අදාළ ප්‍රදේශයේ සංගීත විෂය භාර ස.අ.අ /නි.අ.අ. ගෙන් හා සංගීත ගුරු උපදේශකවරුන්ගෙන් උපදෙස් ලබා ගත යුතු ය.

3.02 යම් තරග ශීර්ෂයකට සහභාගී විය හැකි තරගකරුවන්ගේ උපරිම හා අවම සංඛ්‍යාවන් ඒ ඒ ශීර්ෂ කාණ්ඩ වලට අදාළ තරග කොන්දේසි යටතේ දක්වා ඇත. තරග අවස්ථාවේ දී සහාය වාදන සඳහා හෝ වාදක මණ්ඩලය මෙහෙය වීම සඳහා හෝ ගුරු භවතුන්/ගුරු භවතා ද සහභාගී වන්නේ නම්, ඔවුන් ද, සහභාගී වන තරගකරුවන්ගේ සංඛ්‍යාවෙහි ලා සලකනු ලැබේ.

3.03 තරගකරුවන් සංඛ්‍යාව ලෙස මෙහි ලා සලකනු ලබන්නේ, ප්‍රසංග අංකය ඉදිරිපත් කර අවසාන වන කාලය තෙක් විනිශ්චය මණ්ඩලය අභිමුවෙහි හෝ වේදිකාවෙහි සිටින සංඛ්‍යාවය. යම් හදිසි අවස්ථාවක දී තරගකරුවෙකු තරගය සඳහා ඉදිරිපත් නොකරන්නේ නම් ඔහුගේ /ඇයගේ නම ඉල්ලුම් පත්‍රයෙන් ඉවත් කළ යුතු ය. කලාප, පළාත් සහ අවසාන තරග අවස්ථාවන් හි දී සංවිධායක මණ්ඩලය ඉදිරියේ අත්සන් කළ යුත්තේ ද ඉදිරිපත් වන සිසු සිසුවියන් සහ ගුරු භවතුන් පමණි.

3.04 සෑම තරගකරුවෙක් ම / සහභාගී වන්නෙක් ම පහත ආකාරයට අනන්‍යතාව තහවුරු කළ යුතු ය.

- කලාප තරග අවස්ථාවට විදුහල්පති සහතික කළ නාමලේඛනය ප්‍රමාණවත් වන අතර පළාත් තරග අවස්ථාවට කනිෂ්ඨ කොටසට විදුහල්පති සහතික කළ නාමලේඛනයක් හා සහතික කළ ඡායාරූපයක් ද ජ්‍යෙෂ්ඨ කොටසට විදුහල්පති සහතික කළ නාමලේඛනය සමග පිළිගත් ඕනෑම අනන්‍යතාපත්‍රයක් හෝ හැඳුනුම්පතක් ඉදිරිපත් කළ යුතු ය.
- අවසාන තරග අවස්ථාවේදී අනන්‍යතාව පිළිබඳ ගැටළුවක් පැන නැගී විටෙකදී උප්පැන්න සහතිකය ඉදිරිපත් කළ යුතු ය. කනිෂ්ඨ කොටස්වල සිසුන් කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ සහතික කළ ඡායාරූප පිටපතක්ද ජ්‍යෙෂ්ඨ කොටස්වල සිසුන් පිළිගත් හැඳුනුම්පතක් ද ඉදිරිපත් කළ යුතු ය. සියලු ම තරග ශීර්ෂ සඳහා ඉදිරිපත් වන සිසු ගුරු නාම ලේඛනය විදුහල්පති විසින් සහතික කර නිලමුද්‍රාව තබා පිටපත් දෙකකින් යුතුව ඉදිරිපත් කළ යුතු ය

3.05 යම් තරග ශීර්ෂයකට ඉල්ලුම් කිරීමේ දී මෙම උපදෙස් සංග්‍රහයෙහි අදාළ තරග යටතේ උපලේඛන ගත කොට ඇති ආදර්ශ ඉල්ලුම් පත්‍ර භාවිත කළ යුතු ය. ඉල්ලුම් පත්‍ර සම්පූර්ණ කිරීමේ දී යතුරු ලියනය නොකරන්නේ නම් ඉතා පැහැදිලි අත් අකුරින් සම්පූර්ණ කිරීම අත්‍යවශ්‍ය වේ. නම්වල මුලකුරු ඉංග්‍රීසියෙන් ලිවිය යුතු ය. එසේම වෙනත් පාසල්වලින් ගුරුවරුන් හා සිසුන් සහාය වාදනයට සහභාගී වන්නේ නම්, ඉහත සඳහන් කළ ආකෘතියෙහි ම අදාළ තොරතුරු සඳහන් කළ යුතුය. සෑම තරග අවස්ථාවක් සඳහා ම අංග සම්පූර්ණ ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් කළ යුතු වේ. යම් පාසලක් තරග ශිර්ෂ කිහිපයකට ඉල්ලුම් කිරීමේ දී, එක් තරග ශීර්ෂයකට එක බැගින් වෙන වෙනම ඉල්ලුම්පත් ඉදිරිපත් කළ යුතු ය. නාමලේඛන සකස් කිරීමේ දී අදාළ ශිෂ්‍යයා / ශිෂ්‍යාවගේ නමට ඉදිරියෙන් ශිෂ්‍යයා / ශිෂ්‍යාව වශයෙන් ද ගුරුභවතුන්ගේ නමට ඉදිරියෙන් මයා /මිය /මෙනෙවිය වශයෙන් ද සටහන් කළ යුතු ය.

## 04. කලාප / පළාත් තරග සංවිධානය

4.01 කලාප තරගය, අදාළ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරයා විසින් සෞන්දර්ය අධ්‍යක්ෂ / අදාළ විෂයය භාර නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ / සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ හෝ විෂය ගුරු උපදේශකගේ සහාය ඇතිව සංවිධානය කළ යුතු වේ. කලාප තරගයේ සියලු වගකීම් කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත පැවරෙන අතර, ඔහු / ඇය මෙම උපදෙස් සංග්‍රහය උල්ලංඝනය නොවන පරිදි කලාප තරග ප්‍රතිඵලවල අවසන් තීරක ද වේ. කලාප තරග 2023.06.30 දින වන විට පවත්වා, පළාත් තරග සංවිධානය සඳහා අදාළ ප්‍රතිඵල ලේඛන පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත ඉදිරිපත් කළ යුතු ය.

4.02 පළාත් තරගය අදාළ පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරයා විසින් සංවිධානය කළ යුතු ය. මෙම කටයුතුවල දී පළාතේ අදාළ විෂය භාර නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ / සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරයාට සහාය විය යුතු ය. අවශ්‍ය අවස්ථාවල දී පමණක් පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරයාගේ සහ අධ්‍යාපන අමාත්‍යාංශයේ අධ්‍යාපන අධ්‍යක්ෂ (සෞන්දර්ය) ගේ එකඟතාව සහිතව එම පළාතට අයත් සෞන්දර්ය විෂය භාර නිලධාරියකු, සම්බන්ධීකරණ / සංවිධායක නිලධාරියා වශයෙන් නම් කරනු ඇත. පළාත් තරගයේ සියලු වගකීම් පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත පැවරෙන අතර මෙම උපදෙස් සංග්‍රහය උල්ලංඝනය නොවන පරිදි ඔහු / ඇය පළාත් තරග ප්‍රතිඵලවල අවසන් තීරක ද වේ. යම් විෂයානුබද්ධ ගැටළු අවස්ථාවක පළාතේ අදාළ විෂය භාර නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ/ සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ ගේ නිර්දේශ සහිතව පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් අදාළ තීරණ ගත යුතු ය. පළාත් තරග 2023.09.30 දින වන විට පවත්වා අවසාන තරග සංවිධානය සඳහා ප්‍රතිඵල ලේඛන අධ්‍යාපන අමාත්‍යාංශයේ සෞන්දර්ය අධ්‍යක්ෂ වෙත එවිය යුතු ය.

4.03 කලාප මට්ටමට පෙනී සිට ජයග්‍රහණය කළ සිසු සිසුවියන් ම පළාත් මට්ටමට ද, පළාත් මට්ටමට පෙනී සිට ජයග්‍රහණය කළ සිසු සිසුවියන් ම ජාතික මට්ටමට ද පෙනී සිටීම අනිවාර්ය වේ. මේ සම්බන්ධයෙන් නොවැළැක්විය හැකි යම් ගැටලුවක් මතු වුවහොත්, පාසලේ විදුහල්පතිගේ නිර්දේශ මත කලාප තරග මට්ටමේ දී කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරයාගේත්, පළාත් තරග මට්ටමේ දී පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරයාගේත්, සමස්ත ලංකා තරග මට්ටමේ දී අධ්‍යාපන අමාත්‍යාංශයේ අධ්‍යාපන අධ්‍යක්ෂ (සෞන්දර්ය) ගේ අනුමැතිය මත පමණක් එම ගැටලුව නිරාකරණය කර ගත යුතු ය.

4.04 යම් තරග ශීර්ෂයකින් කලාප තරගයකට ඉදිරිපත් නොවූ කිසිදු පාසලක්, පළාත් තරග අවස්ථාවට සහභාගී නොකිරීමටත්, පළාත් තරග අවස්ථාවට සහභාගී නොවන පාසලක් අවසන්තරගය සඳහා ඉදිරිපත් නොකිරීමටත්, කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරයා, පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරයා, පළාත් සෞන්දර්ය අධ්‍යක්ෂවරයා /සම්බන්ධීකරණ නිලධාරියා වග බලා ගත යුතු ය.

4.05 කලාප /පළාත් තරගවල දී කුමන හේතුවක් නිසා හෝ සම ස්ථාන ලබා නොදිය යුතු ය. එක් තරග ශීර්ෂයකින් ජාතික මට්ටමට නිර්දේශ කළ යුත්තේ එක් පාසලක් පමණි. මෙහි පූර්ණ වගකීම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ සතු වේ. සමස්ත ලංකා තරගයට කැඳවනු ලබන්නේ පළාත් මට්ටමේ තරගයෙන් ප්‍රථම ස්ථානය දිනාගත් පාසල් පමණි. ( මෙම කොන්දේසිවලට පරිබාහිර අවස්ථා වේ නම් ඒවා අදාළ ශීර්ෂ යටතේ දක්වා ඇත.)

## 05. තරග විනිශ්චය

5.01 කලාප තරග විනිශ්චය සඳහා විනිශ්චය මණ්ඩලය අදාළ කලාපයේ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරයා විසින් ද, පළාත් තරග විනිශ්චය කටයුතු සඳහා වන විනිශ්චය මණ්ඩලය අදාළ පලාතේ පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරයා විසින් ද, තම කලාප/පළාත් සෞන්දර්ය හෝ සංගීත විෂය භාර නිලධාරීන්ගේ නිර්දේශ මත පත් කළ යුතු ය. අවසන් තරගයේ විනිශ්චය සංයුතිය තීරණය කරනු ලබනුයේ, අධ්‍යාපන අමාත්‍යාංශයේ සංගීත විෂය භාර අධ්‍යක්ෂගේ උපදේශකත්වයෙන් හා සෞන්දර්ය අධ්‍යක්ෂගේ අනුමැතිය මතය. එමෙන්ම යම් තරග ශීර්ෂයක විෂයානුබද්ධ ගැටළුවක් මතු වී ඇති විටෙක, ඒ පිළිබඳව යම් තීරණයක් ගත යුතු යැයි හැඟේනම්පමණක්, අධ්‍යාපන ලේකම්ගේ එකඟතාව මත විනිශ්චය මණ්ඩලය සමඟ සාකච්ඡා කර තීරණයක් ගැනීම සිදුවේ.

5.02 කලාප/ පළාත් තරග සඳහා සුදුසු විනිශ්චය මණ්ඩලයක් නිර්දේශ කිරීම අදාළ කලාපයේ /පළාතේ සෞන්දර්ය හෝ සංගීත විෂය භාර නි.අ.අ./ ස.අ.අ. මෙන්ම ගුරු උපදේශකගේ ද වගකීම වේ. විනිශ්චය ලබා දීමේ දී අපක්ෂපාතී ව, වගකීම් සහිතව සහ පරිණතභාවයෙන් යුතුව එහි නිරත විය හැකි ප්‍රවීණයන් ඒ සඳහා නිර්දේශ කිරීමත්, තරග කොන්දේසි හා නීති රීති ඇතුළු අදාළ අනෙකුත් කාරණාවන් අරභයා විනිශ්චය මණ්ඩලය මැනැවින් දැනුවත් කිරීමත් පිළිබඳව අදාළ කලාපයේ/පළාතේ සෞන්දර්ය අධ්‍යක්ෂ / නි.අ.අ. , සංගීත විෂය භාර නි.අ.අ./ස.අ.අ. මෙන්ම ගුරු උපදේශක වගකිව යුතු වේ.

5.03 අදාළ තරග අවස්ථාවෙන් පසුව සියලු ම විනිශ්චය සටහන් පත්‍රිකා අදාළ කලාප/ පළාත් අධ්‍යක්ෂවරයාගේ අත්සන සහිතව සුරැකිව තබා ගැනීම කලාපයේ/පළාතේ සෞන්දර්ය /සංගීත විෂය භාර නි.අ.අ. / ස.අ.අ. ගේ වගකීම වේ. තරගයෙන් පසුව ඊට සම්බන්ධ වූ යම් පාසලක් ,කලාප/ පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ /අධ්‍යාපන අමාත්‍යාංශය විසින් නිරීක්ෂණයට ඉල්ලා සිටිය හොත්, තරග ශීර්ෂයට අදාළ එම සටහන් නිරීක්ෂණයට ඉඩ ලබා දිය යුතු ය.

5.04 තරගයේ දී කිසියම් ඒකල හෝ සමූහ හෝ තරග ශීර්ෂයකට තරග වදින කණ්ඩායම් සියල්ල හෝ කිහිපයක් හෝ එකක් හෝ අවශ්‍ය සාධන මට්ටම, එනම් ලකුණු 33 % ක් වන අවම සාධන ලකුණු මට්ටම ඉක්මවා නැති බව විනිශ්චය මණ්ඩලය විසින් තීරණය කරනු ලබන අවස්ථාවක දී එම කණ්ඩායමට හෝ කණ්ඩායම් වලට ජයග්‍රහණය ලබා නො දෙනු ඇත.

5.05 කලාප / පළාත් හා ජාතික තරගය පවත්වන දිනයේ දී ම අදාළ තරග ශීර්ෂයන්හි ප්‍රතිඵල නිකුත් කරනු ලැබේ. යම් ආකාරයකින් මේ සම්බන්ධයෙන් කිසියම් ගැටළුවක් පැන නැගී ඇති විටෙක, අදාළ පරීක්ෂණ වලින් පසුව එම ප්‍රතිඵල නිකුත් කෙරේ. සමස්ත තරග මාලාවෙහි තරග අවස්ථාවන්හි දී විනිශ්චයන් හා සම්බන්ධව විනිශ්චය මණ්ඩල සමග කරුණු සාකච්ඡා කිරීමට තරගකරුවන්ට හෝ ගුරු භවතුන්ට අවස්ථාවක් නොලැබෙන අතර, ඒ පිළිබඳ යම් අදහසක් වේ නම් ප්‍රධාන තරග සංවිධායක වෙත පමණක් ලිඛිත ව කරුණු ඉදිරිපත් කළ යුතු ය.

5.06 තරගයේ කිසියම් අදියරක දී, ඊට සම්බන්ධ යම් පාර්ශවයක් යම්කිසි වංචනික ක්‍රියාවක නිරත වීම මගින් හෝ වෙනත් ආකාරයකින් තරග ප්‍රතිඵල වලට බලපෑමක් ඇති කර තිබෙන බවට කවර හෝ අවස්ථාවක දී වුවද අනාවරණය වුවහොත් සහ එය පිළිගත හැකි සහ වගකීම් සහගත අනාවරණයක් නම්, ඒ පිළිබඳව පරීක්ෂා කර අවශ්‍ය පියවර ගනු ලැබේ.

5.07 යම් තරග ශීර්ෂයක ප්‍රතිඵල නිකුත් කිරීමෙන් පසුව, වැඩි ලකුණු ලබාගත් පාසලකට විරුද්ධව යම් කිසි අභියාචනයක් ඉදිරිපත් වී, චෝදනාවේ බරපතලකම අනුව අදාළ පාසල එම තරග ශීර්ෂයෙන් ඉවත් කරන්නේ නම්, ඊළඟ ඉහළම ලකුණු මට්ටම ලබාගත් පාසලට ජයග්‍රහණ අවස්ථා පිළිවෙලින් හිමි වේ.

## 06. අදාළ වෙනත් කරුණු

6.01 මෙම තරගයේ දී වාර්ෂික චක්‍රලේඛය මගින් නම් කරන ශීර්ෂ සඳහා පමණක් ශ්‍රැතිය පවත්වා ගැනීමට ඉලෙක්ට්‍රොනික තාම්පුරාවක් භාවිතා කළ හැකි අතර තරග ශීර්ෂ **E.2.121 , E.2.122 , සහ E.2.123** සඳහා සහාය වාදන භාණ්ඩයක් ලෙස විදුලි ඕගනයක් ද (Key Board) යොදාගත හැකිය. අනෙකුත් සියලු ම තරග ශීර්ෂ සඳහා විද්‍යුත් සංගීත භාණ්ඩ භාවිතා කළ නොහැකිය.

6.02 භාවිතා කරන ඉලෙක්ට්‍රොනික තාම්පුරා/ ඕගන් සඳහා තරගය පවත්වනු ලබන විදුහලේ විදුලිය පරිපථයෙන් විදුලිය සම්පාදනය නො කෙරේ.

6.03 තරග ශීර්ෂ **A.2.17 , A.2.18 , B.2.60 , B.2.61 , C.2.87** සහ **C.2.88** සඳහා " ස්කේල් චේන්ජර් " හාර්මෝනියම් භාවිතා කරන්නේ නම් , යතුරු පුවරුව වෙනස් කිරීමකින් තොරව වාදනය කල යුතු ය.

6.04 සමූහ ගායන ශීර්ෂ සඳහා වාදනයෙන් සහාය වන්නන් හට ගායනයෙන් සහාය වීම කිසිසේත්ම සිදු කල නොහැකිය.

6.05 තරග අවස්ථාවන්ට දෙමව්පියන්ගේ සහ වෙනත් පාර්ශවයන්ගේ මැදිහත් වීම හෝ සහභාගිත්වය හෝ සිදු නො කිරීමට වග බලා ගත යුතු වේ.

## . 07. සහතික පත්‍ර හා ජය සංකේත

7.01 කලාප හා පළාත් මට්ටමේ තරගවලින් ජයග්‍රහණය ලබා ගන්නා සිසුන්ට සහතික පත්‍ර පිරි නැමීම කලාපය හා පළාත් මට්ටමින් කළ යුතු වේ. ජාතික මට්ටමේ ජයග්‍රාහකයින් සඳහා අධ්‍යාපන අමාත්‍යාංශය මගින් සහතික පත්‍ර පිරි නමනු ලැබේ.

7.02 සාම්ප්‍රදායිකව සමස්ත ලංකා පාසල් සංගීත තරගයේ දී පිරිනමනු ලබන පහත සඳහන් සම්මාන මෙවර ද ඉදිරිපත්වන ශීර්ෂ අනුව ප්‍රදානය කෙරේ. ඒ අනුව ,සමූහ තරග ශීර්ෂ කාණ්ඩවලින් වැඩිම ලකුණු ලබා ගන්නා ප්‍රසංග අංග සඳහා පහත විෂයයන් යටතේ සම්මාන ප්‍රදානය කෙරේ.

- ශාස්ත්‍රීය සංගීත අංශ සඳහා — ලයනල් එදිරිසිංහ සම්මානය
- ජන සංගීත වාදන අංශ සඳහා — ඩබ්.බී.මකුලොලුව සම්මානය
- ජන සංගීත ගායන අංශ සඳහා — සී.ද.එස් කුලතිලක සම්මානය
- නිර්මාණ සංගීත අංශ සඳහා — සරත් දසනායක සම්මානය
- සංගීතමය නාට්‍ය අංශ සඳහා — එදිරිවීර සරත්චන්ද්‍ර සම්මානය
- සමූහ වාදන අංශ සඳහා — සෝමදාස ඇල්විටිගල සම්මානය
- වෙනත් ව්‍යවහාරික සංගීත ගායන අංශ සඳහා — ඩබ්.ඩී.අමරදේව සම්මානය
- වෙනත් ව්‍යවහාරික සංගීත වාදන අංශ සඳහා — ප්‍රේමසිරි කේමදාස සම්මානය

**ඊට අමතර වශයෙන් -**

- ඒකල තරග ශීර්ෂ වලින් වැඩිම ලකුණු ලබාගත් තරග කරුට “ සංගීත් ” සම්මානය
- ප්‍රථම ස්ථාන තුනක් ලබා ගත් පාසල් සඳහා “උත්තම” සංගීත සම්මානය

7.03 වාර්ෂික චක්‍රලේඛය මඟින් නම් කරනු ලබන ඒකල තරග ශීර්ෂ වලින් ප්‍රථම ස්ථාන ජයග්‍රාහී තරග කරුවන්ට “ සංගීත් අභිමානි ” සම්මානය පුද කෙරේ.

7.04 සියලුම ඒකල සහ සමූහ තරග ශීර්ෂයන්හි,

| | |
|---|---|
| ප්‍රථම ස්ථානය | - ස්වර්ණ සම්මානය නමින් ද, |
| දෙවන ස්ථානය | - රජත සම්මානය නමින් ද, |
| තෙවන ස්ථානය | - ලෝකඩ සම්මානය නමින් ද, |
| සිව්වන ස්ථානය | - සම්වාද් සම්මානය නමින් ද, |
| පස්වන ස්ථානය | - සාමාර්ථ සම්මානය නමින් ද, හඳුන්වනු ලැබේ. |

## 08. විනය සහ වගවීම - පිළිබඳ අදහස්

8.01 එක් එක් තරග අවස්ථාවට සහභාගී වීමට තරග මධ්‍යස්ථානවලට සහ නේවාසික මධ්‍යස්ථානවලට පැමිණෙන සිසු සිසුවියන්ගේ විනය, හැසිරීම, ආරක්ෂාව හා භාරකාරත්වය පිළිබඳව විදුහල්පතිවරුන්ගේ සහ කණ්ඩායම් භාර ගුරු මහත්ම මහත්මීන්ගේ විශේෂ අවධානය යොමු විය යුතු ය.

8.02 ශිෂ්‍යාවන්ගේ භාරකාරත්වය ගුරු මහත්මීන්ට ද, ශිෂ්‍යයින්ගේ භාරකාරත්වය ගුරු මහත්වරුන්ට ද, පැවරිය යුතු ය. ශිෂ්‍යයින් හා ශිෂ්‍යාවන් යන දෙපිරිසම සහභාගී වන විට ගුරු මහත්ම මහත්මීන් යන දෙපාර්ශවයටම භාරකාරත්වය පැවරිය යුතු ය.

8.03 තරග පරිශ්‍රය සහ ක්‍රියාකාරකම් ආශ්‍රයෙහි දී ඔබ පාසල නියෝජනය කරමින් සහභාගී වන්නන්ගෙන් කිසියම් අයථා සිදුවීමක් සිදුවුවහොත් ඒ සඳහා භාරකරුවන්ලෙස සහභාගී වන ගුරුභවතුන් වගකීමට බැඳේ. තරගය හා සම්බන්ධ කිසිදු අවස්ථාවක් සඳහා දෙමාපියන් සහ වෙනත් සුභපතන්නන් හෝ පාර්ශවකරුවන් සහභාගි කර නොගත යුතු ය. (මේ පිළිබඳව විදුහල්පති වගකීමට බැඳේ.)

8.04 මෙම තරගය සඳහා අයදුම් කර ඉදිරිපත්වන සියලුම පාසල් හා අනෙකුත් අදාල පාර්ශවකරුවන් තරගයේ සෑම අවස්ථාවකදී ම මෙහි සඳහන් සියලුම නීති රීති හා විධිවිධාන අනිවාර්යයෙන්ම පිළිපැදිය යුතු වේ.

8.05 මෙම තරගයේ සෑම අවස්ථාවකදී ම යම් විදුහලක් පිළිබඳ නීතිමය හා විනය ආශ්‍රිත කටයුතු සිදු වනුයේ අදාල විදුහලේ විදුහල්පතිවරයාත්, කලාප හා පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් සහ අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් වෙනුවෙන් අධ්‍යාපන අධ්‍යක්ෂවරයාගේ, (සෞන්දර්ය) මැදිහත් වීමෙනි. පාසලේ වෙනත් පාර්ශවයන් එම කටයුතුවලට මැදිහත් කර නොගැනීමේ වගකීම ද අදාළ පාසලේ විදුහල්පතිවරයා වෙත පැවරේ.

8.06 කිසිදු හේතුවක් මත පාසලකට මෙම චක්‍රලේඛයෙහි දී ඇති උපදෙස් පරිශීලනය කිරීමට නොහැකි වීම හෝ නොකිරීම හෝ නිදහසට කරුණක් නොවන අතර, ඉන් සිසු සිසුවියනට සිදුවිය හැකි හානි, නොසැලකිලිමත් බවේ හා වගකීම් විරහිත බවේ ප්‍රතිඵල ලෙස සලකා ඊට වගකිව යුතු පාර්ශවයන්ට අදාළ විනයානුකූල පියවර ගනු ලැබේ.

8.07 තරගයට සහභාගී වන්නන්, පාර්ශවකරුවන්, සිසු සිසුවියන් මෙන්ම ගුරු භවතුන්, නිළධාරීන්, තරග විනිසුරුවන් ගේ මෙන්ම පාසල් සහ අධ්‍යාපන ආයතනයන් හි පෞරුෂයට, ප්‍රතිරූපයට සහ ගෞරවයට හානිදායක වන අගතියට පත්වන දේ සිදුකරමින් ප්‍රසිද්ධ කරනු ලබන හෝ ක්‍රියාකරනු ලබන අයට විරුද්ධව නීත්‍යානුකූලව කටයුතු කරනු ලැබේ.

- තරගයට අදාළ තරග ශීර්ෂ , සෞන්දර්ය අධ්‍යාපන අධ්‍යක්ෂගේ අත්සනින් යුතුව මෙම චක්‍රලේඛයට යාකර ඉදිරිපත් කරනු ලැබේ.

මෙම තරගය සඳහා ඉදිරිපත් වන සියලු ම තරග කරුවන් හා අනෙකුත් පාර්ශව කරුවන් තරගයේ සෑම අවස්ථාවක දීම මෙම තරග චක්‍රලේඛයෙහි සඳහන් සියලු ම නීති රීති පිළිපැදීමටත්, විනිශ්චය මණ්ඩලයේ තීරණය අවසාන තීරණය වශයෙන් පිළිගැනීමටත් එකඟ විය යුතු ය. සමස්ත ලංකා මට්ටමෙහි අවසාන තරගයට ඉදිරිපත් වන පාසල් සඳහා ලබා දෙන තරග කාලසටහන් ගොනුවෙහි අමුණා ඇති ප්‍රකාශනය හොඳින් කියවා තේරුම් ගෙන විදුහල්පති විසින් නියමිත ස්ථානයෙහි අත්සන් යොදා තරගයට ඉදිරිපත් විය යුතු ය. මෙම චක්‍රලේඛයෙහි දක්වා ඇති වගන්ති හා සීමාවන් එකකට හෝ කිහිපයකට හෝ පටහැණි ව කටයුතු කර ඇති බව අනාවරණය වුවහොත් තරගයේ කුමන අවස්ථාවක දී වුවද ප්‍රතිඵල ලේඛන වලින් එම විදුහල ඉවත් කිරීම , විනයානුකූල පියවර ගැනීම ඇතුළු අදාළ වෙනත් තීරණ ගැනීම අධ්‍යාපන අමාත්‍යාංශය සතුවේ.

එම්.එන්.රණසිංහ
ලේකම්
අධ්‍යාපන අමාත්‍යාංශය

## A. කනිෂ්ඨ කොටස (6 - 8 ශ්‍රේණි සඳහා)

A.1.1 **ඒකල ගායනය** - (කනිෂ්ඨ)/ගැහැණු /රාගධාරී/ භූපාලි රාගය
A.1.2 **ඒකල ගායනය** - (කනිෂ්ඨ)/පිරිමි /රාගධාරී/ භූපාලි රාගය
**(A.1.1 , A.1.2 ශීර්ෂයන්ට සහභාගී විය හැක්කේ ශිෂ්‍ය සංඛ්‍යාව 300 ට අඩු පාසල් සඳහා පමණි.)**

A.1.3 **ඒකල ගායනය** - (කනිෂ්ඨ)/ගැහැණු /රාගධාරී/යමන් රාගය
A.1.4 **ඒකල ගායනය** - (කනිෂ්ඨ)/පිරිමි /රාගධාරී/යමන් රාගය
**(A.1.3 , A.1.4 ශීර්ෂයන්ට සහභාගී විය හැක්කේ ශිෂ්‍ය සංඛ්‍යාව 301 - 1000 ත් පාසල් සඳහා පමණි.)**

A.1.5 **ඒකල ගායනය** - (කනිෂ්ඨ)/ගැහැණු /රාගධාරී/ කාෆි රාගය
A.1.6 **ඒකල ගායනය** - (කනිෂ්ඨ)/පිරිමි /රාගධාරී/ කාෆි රාගය
**(A.1.5 , A.1.6 ශීර්ෂයන්ට සහභාගී විය හැක්කේ ශිෂ්‍ය සංඛ්‍යාව 1001 ට වැඩි පාසල් සඳහා පමණි.)**

**A.1.1 සිට A.1.6 දක්වා ශීර්ෂයන්ට අදාළ පොදු කොන්දේසි**

- හින්දි බසින් රචිත ඛ්‍යාල් ශෛලියේ මධ්‍යලය ගීතයක් විය යුතු ය.
- සාම්ප්‍රදායික ඒකල ශාස්ත්‍රීය ගායනා අංග වලින් පෝෂිත විය යුතු ය.
- වෙනත් ගායන ශෛලීන් මිශ්‍රකළ නොහැකිය.
- කාලය අවම විනාඩි 04 කි. උපරිම විනාඩි 06 කි.
- සහභාගී විය හැකි සංඛ්‍යාව - තරගකරු හැර සහාය වාදකයින් උපරිම සංඛ්‍යාව 04 කි.
- සාම්ප්‍රදායිකව භාවිත කරනු ලබන ශ්‍රැති වාද්‍ය භාණ්ඩ මෙන්ම ඉලෙක්ට්‍රොනික් තාම්පුරාවද යොදා ගත හැකිය. අවශ්‍යනම් ස්වරමණ්ඩලයක් ද යොදාගත හැකිය.
- ප්‍රධාන තරගකරුට අවශ්‍ය වන්නේනම් තාම්පුරාව හෝ ස්වරමණ්ඩලය වයමින් ගැයීමට හැකිය.

**A.1.7** **ඒකල ගායනය - (කනිෂ්ඨ) /**ගැහැණු **/ සරල ගී** "දුනුකෙයියා මලක් වගේ "ගීතය.
(ශිල්පිනී - සුජාතා අත්තනායක)
**A.1.8** **ඒකල ගායනය - (කනිෂ්ඨ) /පිරිමි / සරල ගී "මේ තරම් සියුමැලිද කළුගල් "**ගීතය.
(ශිල්පී - සුනිල් එදිරිසිංහ)
**(A.1.7 , A.1.8 ශීර්ෂයන්ට සහභාගී විය හැක්කේ ශිෂ්‍ය සංඛ්‍යාව 300 ට අඩු පාසල් සඳහා පමණි.)**

**A.1.9** **ඒකල ගායනය - (කනිෂ්ඨ) /**ගැහැණු **/ සරල ගී " කඳුලු හෙළා නැඹිලියට "**ගීතය.
(ශිල්පිනී - දීපිකා ප්‍රියදර්ශනී පීරිස්)
**A.1.10** **ඒකල ගායනය - (කනිෂ්ඨ) /පිරිමි / සරල ගී " ඔබේ නමින් සැය බඳිමි "**ගීතය.
(ශිල්පී - W.D.අමරදේව)
**(A.1.9 , A.1.10 ශීර්ෂයන්ට සහභාගී විය හැක්කේ ශිෂ්‍ය සංඛ්‍යාව 301 - 1000 ත් පාසල් සඳහා පමණි.)**

**A.1.11** **ඒකල ගායනය - (කනිෂ්ඨ) /**ගැහැණු **/ සරල ගී " සඳ කොමලී තරු පිරිවරලා "**ගීතය.
(ශිල්පිනී - ලතා වල්පොල)
**A.1.12** **ඒකල ගායනය - (කනිෂ්ඨ) /පිරිමි / සරල ගී " මේ ජීවනයේ මුළු සංසාරේ "** ගීතය.
(ශිල්පී - H.R.ජෝතිපාල)
**(A.1.11 , A.1.12 ශීර්ෂයන්ට සහභාගී විය හැක්කේ ශිෂ්‍ය සංඛ්‍යාව 1001 ට වැඩි පාසල් සඳහා පමණි.)**

**ඉහත A.1.7 සිට A.1.12 දක්වා ශීර්ෂයන්ට අදාළ පොදු කොන්දේසි**

- එක් පාසලකට ඉදිරිපත් විය හැක්කේ ඉහත එක් තරග ශීර්ෂයක් සඳහා පමණි.
- තරග ශීර්ෂයට අදාළව, දී ඇති සරල ගීතය ගායනය කළ යුතු ය.
- නම් කර ඇති ගීතයේ පෙර වාදන , අතුරු වාදන සහ ගීතයේ තනුව වෙනස් නොකළ යුතු ය.
- **ගීතයේ මුල් නාදමාලාවට ඇතුළත් නොවන කිසිදු අලංකාර ප්‍රයෝගයක් භාවිත නොකළ යුතු ය.**
- කාලය - ගීතයට අදාළ කාලය ලෙස සලකන්න.
- සහභාගීවිය හැකි සංඛ්‍යාව - තරගකරු හැර සහාය වාදකයින් උපරිම සංඛ්‍යාව 05 කි.

A.1.13 **සමූහ ගායනය - (කනිෂ්ඨ)** ගැහැණු/ජන ගී (ගොයම් ගී සහ නෙළුම් ගී)

A.1.14 **සමූහ ගායනය - (කනිෂ්ඨ)** පිරිමි/ජන ගී (ලී කෙළි ගී සහ රබන් ගී)

A.1.15 **සමූහ ගායනය - (කනිෂ්ඨ)** මිශ්‍ර/ජන ගී (ප්‍රශස්ති ගී සහ හටන් ගී)

**(A.1.13 සිට A.1.15 ශීර්ෂයන්ට සහභාගී විය හැක්කේ ශිෂ්‍ය සංඛ්‍යාව 300 ට අඩු පාසල් සඳහා පමණි.)**

A.1.16 **සමූහ ගායනය - (කනිෂ්ඨ)** ගැහැණු/ජන ගී (ගොයම් ගී සහ නෙළුම් ගී)

**A.1.17 සමූහ ගායනය - (කනිෂ්ඨ)** පිරිමි/ජන ගී (ලී කෙළි ගී සහ රබන් ගී)

**A.1.18 සමූහ ගායනය - (කනිෂ්ඨ)** මිශ්‍ර/ජන ගී (ප්‍රශස්ති ගී සහ හටන් ගී)

**(A.1.16 සිට A.1.18 ශීර්ෂයන්ට සහභාගී විය හැක්කේ ශිෂ්‍ය සංඛ්‍යාව 301 -1000ත් පාසල් සඳහා පමණි.)**

**A.1.19 සමූහ ගායනය - (කනිෂ්ඨ)** ගැහැණු/ජන ගී (ගොයම් ගී සහ නෙළුම් ගී)

**A.1.20 සමූහ ගායනය - (කනිෂ්ඨ)** පිරිමි/ජන ගී (ලී කෙළි ගී සහ රබන් ගී)

**A.1.21 සමූහ ගායනය - (කනිෂ්ඨ)** මිශ්‍ර/ජන ගී (ප්‍රශස්ති ගී සහ හටන් ගී)

**(A.1.19 සිට A.1.21 ශීර්ෂයන්ට සහභාගී විය හැක්කේ ශිෂ්‍ය සංඛ්‍යාව 1001 ට වැඩි පාසල් සඳහා පමණි.)**

**A.1.22 සමූහ ගායනය - (කනිෂ්ඨ)** ගැහැණු/ජන ගී (උඩරට සහ පහතරට ශාන්තිකර්ම ගී)

**A.1.23 සමූහ ගායනය - (කනිෂ්ඨ)** පිරිමි/ජන ගී (උඩරට සහ පහතරට ශාන්තිකර්ම ගී)

**A.1.24 සමූහ ගායනය - (කනිෂ්ඨ)** මිශ්‍ර/ජන ගී (උඩරට සහ පහතරට ශාන්තිකර්ම ගී)

( **A.1.22 සිට A.1.24** ශීර්ෂයන්ට සහභාගි විය හැක්කේ ජාත්‍යන්තර පාසල්, රජයේ නොවන පාසල් සහ එවැනි වෙනත් පුද්ගලික පාසල්වලට පමණි.)

**<u>A.1.13 සිට A.1.24 දක්වා ශීර්ෂයන්ට අදාළ පොදු කොන්දේසි</u>**

- එක් පාසලකට ඉදිරිපත් විය හැක්කේ ඉහත එක් තරග ශීර්ෂයක් සඳහා පමණි.
- තරග ශීර්ෂ සඳහා ලබාදී ඇති ගීත දෙවර්ගයම ඇතුළත් වන පරිදි ගායනය ඉදිරිපත් කළ යුතු ය.
- සාම්ප්‍රදායික නාද මාලාවලින් බැහැර නොවිය යුතු ය.
- ගායනයට බාධා නොවන සේ උචිත පරිදි ප්‍රකාශනාත්මක අංග චලන යොදා ගත හැකි ය.
- උචිත පරිදි සමූහ ගායන අංග යොදා විචිත්‍රවත් කළ හැකි ය.
- ජන ගී ආර රැකෙන පරිදි විද්‍යුත් නොවන සංගීත භාණ්ඩ යොදා ගනිමින් සංගීත සංයෝජනය කළ හැකි ය.
- සහභාගි විය හැකි සංඛ්‍යාව, වාදක මඩුල්ල හැර අවමය 18 කි. වාදක මඩුල්ල සමග උපරිමය 25 කි.
- කාලය අවම විනාඩි 03 කි. උපරිම විනාඩි 05 කි.
- දඬුබෙරය යොදාගත හැකි ය.

**A.2.1 ඒකල වාදනය - (කනිෂ්ඨ)**/ගැහැණු/රාගධාරී/වයලීනය/නියමිත රාගය - භෛරවී රාගය

**A.2.2 ඒකල වාදනය - (කනිෂ්ඨ)**/පිරිමි/රාගධාරී/වයලීනය/නියමිත රාගය - භෛරවී රාගය

**A.2.3 ඒකල වාදනය - (කනිෂ්ඨ)**/ගැහැණු/රාගධාරී/එස්රාජ්/නියමිත රාගය - භූපාලි රාගය

**A.2.4 ඒකල වාදනය - (කනිෂ්ඨ)**/පිරිමි/රාගධාරී/එස්රාජ්/නියමිත රාගය - භූපාලි රාගය

**A.2.5 ඒකල වාදනය - (කනිෂ්ඨ)**/ගැහැණු/රාගධාරී/බටනලා/නියමිත රාගය - කාෆි රාගය

**A.2.6** **ඒකල වාදනය - (කනිෂ්ඨ)**/පිරිමි/රාගධාරී/බටනලා/නියමිත රාගය - කාෆි රාගය

**A.2.7** **ඒකල වාදනය - (කනිෂ්ඨ)**/ගැහැණු/රාගධාරී/දිල්රුබා/නියමිත රාගය - යමන් රාගය

**A.2.8** **ඒකල වාදනය - (කනිෂ්ඨ)**/පිරිමි/රාගධාරී/දිල්රුබා/නියමිත රාගය - යමන් රාගය

**A.2.9** **ඒකල වාදනය - (කනිෂ්ඨ)**/ගැහැණු/රාගධාරී/සිතාර්/නියමිත රාගය - බිලාවල්/අල්හෛයා බිලාවල් රාගය

**A.2.10** **ඒකල වාදනය - (කනිෂ්ඨ)**/පිරිමි/රාගධාරී/සිතාර්/නියමිත රාගය - බිලාවල්/අල්හෛයා බිලාවල් රාගය

**ඉහත A.2.1 සිට A.2.10 දක්වා ශිර්ෂයන්ට අදාළ පොදු කොන්දේසි**

- මධ්‍යලය වාදනයක් විය යුතු ය.
- ඉලෙක්ට්‍රොනික තාම්පුරාව යොදා ගත හැකි ය.
- සාම්ප්‍රදායික ඒකල ශාස්ත්‍රීය වාදන අංගවලින් පෝෂිත විය යුතු ය.
- නිවැරදි ඉරියව් සහ හස්ත සාධන පිළිබඳ අවධානය යොමු කළ යුතු වේ.
- කාලය අවම විනාඩි 04 කි. උපරිම විනාඩි 05 කි.
- සහභාගි විය හැකි සංඛ්‍යාව: තරගකරු හැර සහාය වාදකයින් උපරිම 03කි.

**A.2.11** **ඒකල වාදනය-(කනිෂ්ඨ)**/ගැහැණු/තබ්ලා/ නියමිත තාලය - ත්‍රිතාල්

**A.2.12** **ඒකල වාදනය-(කනිෂ්ඨ)**/පිරිමි/තබ්ලා/ නියමිත තාලය - ත්‍රිතාල්

**(A.2.11 , A.2.12 ශීර්ෂයන්ට සහභාගී විය හැක්කේ ශිෂ්‍ය සංඛ්‍යාව 300 ට අඩු පාසල් සඳහා පමණි.)**

**A.2.13** **ඒකල වාදනය-(කනිෂ්ඨ)**/ගැහැණු/තබ්ලා/ නියමිත තාලය - ත්‍රිතාල්

**A.2.14** **ඒකල වාදනය-(කනිෂ්ඨ)**/පිරිමි/තබ්ලා/ නියමිත තාලය - ත්‍රිතාල්

**(A.2.13 , A.2.14 ශීර්ෂයන්ට සහභාගී විය හැක්කේ ශිෂ්‍ය සංඛ්‍යාව 301 - 1000 ත් පාසල් සඳහා පමණි.)**

**A.2.15** **ඒකල වාදනය-(කනිෂ්ඨ)**/ගැහැණු/තබ්ලා/ නියමිත තාලය - ත්‍රිතාල්

**A.2.16** **ඒකල වාදනය-(කනිෂ්ඨ)**/පිරිමි/තබ්ලා/ නියමිත තාලය - ත්‍රිතාල්

**(A.2.15 ,A.2.16 ශීර්ෂයන්ට සහභාගී විය හැක්කේ ශිෂ්‍ය සංඛ්‍යාව 1001 ට වැඩි පාසල් සඳහා පමණි.)**

**ඉහත A.2.11 සිට A.2.16 දක්වා ශිර්ෂයන්ට අදාළ පොදු කොන්දේසි**

- මධ්‍යලය වාදනයක් විය යුතු ය.
- වයනු ලබන ලෙහෙරාවකට අනුගත විය යුතු ය.
- ශාස්ත්‍රිය තබ්ලා වාදන අංග හා ප්‍රබන්ධ සාම්ප්‍රදායික,පිළිවෙලින් ඉදිරිපත් කළ යුතු ය.
- නිවැරදි වාදන ඉරියව් සහ නාද නිෂ්පත්තිය පිළිබඳ අවධානය යොමු කළ යුතු වේ.
- කාලය අවම විනාඩි 03කි. උපරිම විනාඩි 04 කි.
- සහභාගි විය හැකි සංඛ්‍යාව - තරගකරු හැර, ස්වර වාදනය සඳහා සහාය වාදකයින් උපරිම 02 කි.

**A.2.17** **ඒකල වාදනය-(කනිෂ්ඨ)**/ගැහැණු/ගී අනුවාදන-හාර්මෝනියම්/ "පූර්ණ චන්ද්‍රා ලෙසේ" **($E^b$ minor)**
**(ශිල්පී - ටී.එම්.ජයරත්න)**

**A.2.18** **ඒකල වාදනය-(කනිෂ්ඨ)**/පිරිමි/ගී අනුවාදන-හාර්මෝනියම්/ " මනුසතා ලෝකෙ ඉපදී" **(E)**
**(ශිල්පී - මොහිදීන් බෙග්)**

**A.2.17 සහ A.2.18 ශීර්ෂයන්ට අදාළ පොදු කොන්දේසි.**

- ගීතය ඉදිරියේ, දී ඇති ස්කේලයම (scale) පාදක කරගත යුතු ය.
- සහාය තාල වාදනය සඳහා තබ්ලාව පමණක් යොදා ගත යුතු ය.
- තාල වාද්‍ය භාණ්ඩය සමග අවශ්‍ය නම් බොක්ස් ගිටාරය ද සහාය වාදනයට යොදාගත හැකි ය.
- කාලය - නියමිත ගීතයට ගතවන කාලය ලෙස සලකන්න.
- සහභාගි විය හැකි සංඛ්‍යාව - තරගකරු හැර උපරිම දෙදෙනෙකු ය.

**A.2.19.** **සමූහ ගී අනු වාදනය-(කනිෂ්ඨ)/**ගැහැණු/ "ගංගා දියරැල් ගලා" ගීතය.
(ශිල්පී - පුන්සිරි සොයිසා )

**A.2.20.** **සමූහ ගී අනු වාදනය - (කනිෂ්ඨ) /**පිරිමි/ "වළාකුළෙන් බැස "ගීතය.
(ශිල්පී - සුනිල් සාන්ත )

**A.2.21.** **සමූහ ගී අනු වාදනය-(කනිෂ්ඨ)**/මිශ්‍ර/ " කුළ ගෙදරින් දුම්බර කඳු වැටියේ " ගීතය.
(ශිල්පී - බන්දුල විජේවීර)

**(A.2.19 සිට A.2.21 ශීර්ෂයන්ට සහභාගී විය හැක්කේ ශිෂ්‍ය සංඛ්‍යාව 300 ට අඩු පාසල් සඳහා පමණි.)**

**A.2.22.** **සමූහ ගී අනු වාදනය-(කනිෂ්ඨ)/**ගැහැණු/ "රුවන් නිදන හෙළ බිමයි" ගීතය.
(ශිල්පී - වික්ටර් රත්නායක )

**A.2.23** **සමූහ ගී අනු වාදනය - (කනිෂ්ඨ) /**පිරිමි/ "බිම්බරක් සෙනඟ ගැවසුනු "ගීතය.
(ශිල්පී - ගුණදාස කපුගේ )

**A.2.24** **සමූහ ගී අනු වාදනය-(කනිෂ්ඨ)**/මිශ්‍ර/ " මිනිසා සුවඳයි මලසේ "ගීතය.
(ශිල්පී - සුනිල් එදිරිසිංහ)

**(A.2.22 සිට A.2.24 ශීර්ෂයන්ට සහභාගී විය හැක්කේ ශිෂ්‍ය සංඛ්‍යාව 301 -1000ත් පාසල් සඳහා පමණි.)**

**A.2.25** **සමූහ ගී අනු වාදනය-(කනිෂ්ඨ)/**ගැහැණු / "ඈත ගව්ගණන් දුරින්" ගීතය.
(ශිල්පී - නාරද දිසාසේකර )

**A.2.26** **සමූහ ගී අනු වාදනය - (කනිෂ්ඨ) /**පිරිමි/ "තෙදිනි විරාජ රුවිනි විරාජ "ගීතය.
(ශිල්පී - එඩ්වඩ් ජයකොඩි)

**A.2.27** **සමූහ ගී අනු වාදනය-(කනිෂ්ඨ)**/මිශ්‍ර/ "හෙමින් සැරේ පියා විදා"ගීතය.
(ශිල්පී - ටී.එම් .ජයරත්න)

**(A.2.25 සිට A.2.27 ශීර්ෂයන්ට සහභාගී විය හැක්කේ ශිෂ්‍ය සංඛ්‍යාව 1001 ට වැඩි පාසල් සඳහා පමණි.)**

**A.2.19 සිට A.2.27 දක්වා ශිර්ෂයන්ට අදාළ පොදු කොන්දේසි**

- එක් පාසලකට සහභාගී විය හැක්කේ මින් එක් ශීර්ෂයකට පමණි.
- සහභාගි විය හැකි සංඛ්‍යාව - වාදක මණ්ඩලය (හසුරුවන්නා ද ඇතුළුව) අවම 18 කි. උපරිම 25 කි.
- කාලය-අදාළ ගීතයට නියමිත කාලය ලෙස සලකන්න.
- එක් වාදකයෙකුට වාද්‍ය භාණ්ඩ කිහිපයක් වුවද වාදනය කළ හැකිය. ආදේශ භාණ්ඩ,විද්‍යුත් භාණ්ඩ සහ පියානෝව හැර ඕනෑම සංගීත භාණ්ඩයක් භාවිතා කළ හැකි ය. දඬු බෙරය ද භාවිත කළ හැකි ය. කටහඬ භාවිත කළ නොහැකිය.
- තරග ශීර්ෂය යටතේ නම් කර ඇති ගීතයේ පෙරවාදන , අතුරුවාදන සහ ගීතයේ තනුව වෙනස් නොකළ යුතු ය. සමූහ වාදන අංගවලින් විචිත්‍රවත් කළ හැකි ය.
- **ගීතයේ මුල් නාදමාලාවට ඇතුළත් නොවන කිසිදු අලංකාර ප්‍රයෝගයක් භාවිත නොකළ යුතු ය.**

**A.2.28** **ඒකල වාදනය - (කනිෂ්ඨ)**/ගැහැණු/රාගධාරී/වයලීනය/නියමිත රාගය - භෛරවී රාගය

**A.2.29** **ඒකල වාදනය - (කනිෂ්ඨ)**/පිරිමි/රාගධාරී/වයලීනය/නියමිත රාගය - භෛරවී රාගය

**A.2.30** **ඒකල වාදනය - (කනිෂ්ඨ)**/ගැහැණු/රාගධාරී/එස්රාජ්/නියමිත රාගය - භූපාලි රාගය

**A.2.31** **ඒකල වාදනය - (කනිෂ්ඨ)**/පිරිමි/රාගධාරී/එස්රාජ්/නියමිත රාගය - භූපාලි රාගය

**A.2.32** **ඒකල වාදනය - (කනිෂ්ඨ)**/ගැහැණු/රාගධාරී/බටනලා/නියමිත රාගය - කාෆි රාගය

**A.2.33** **ඒකල වාදනය - (කනිෂ්ඨ)**/පිරිමි/රාගධාරී/බටනලා/නියමිත රාගය - කාෆි රාගය

**A.2.34** **ඒකල වාදනය - (කනිෂ්ඨ)**/ගැහැණු/රාගධාරී/දිල්රුබා/නියමිත රාගය - යමන් රාගය

**A.2.35** **ඒකල වාදනය - (කනිෂ්ඨ)**/පිරිමි/රාගධාරී/දිල්රුබා/නියමිත රාගය - යමන් රාගය

**A.2.36** **ඒකල වාදනය - (කනිෂ්ඨ)**/ගැහැණු/රාගධාරී/සිතාර්/නියමිත රාගය - බිලාවල්/අල්හෛයා බිලාවල් රාගය

**A.2.37** **ඒකල වාදනය - (කනිෂ්ඨ)**/පිරිමි/රාගධාරී/සිතාර්/නියමිත රාගය - බිලාවල්/අල්හෛයා බිලාවල් රාගය

**ඉහත A.2.28 සිට A.2.37 දක්වා ශීර්ෂයන්ට අදාළ පොදු කොන්දේසි**

- **A.2.28 සිට A.2.37 දක්වා ශීර්ෂයන්ට සහභාගි විය හැක්කේ ජාත්‍යන්තර පාසල්, රජයේ නොවන පාසල් සහ එවැනි වෙනත් පුද්ගලික පාසල්වලට පමණි.**
- මධ්‍යලය වාදනයක් විය යුතු ය.
- ඉලෙක්ට්‍රොනික තාම්පුරාව යොදා ගත හැකි ය.
- සාම්ප්‍රදායික ඒකල ශාස්ත්‍රීය වාදන අංගවලින් පෝෂිත විය යුතු ය.
- නිවැරදි ඉරියව් සහ හස්ත සාධන පිළිබඳ අවධානය යොමු කළ යුතු වේ.
- කාලය අවම විනාඩි 04 කි. උපරිම විනාඩි 05කි.
- සහභාගි විය හැකි සංඛ්‍යාව - තරගකරු හැර සහාය වාදකයින් උපරිම 03කි.

**A.2.38** **ඒකල වාදනය-(කනිෂ්ඨ)**/ගැහැණු/තබ්ලා/ නියමිත තාලය - ත්‍රිතාල්

**A.2.39** **ඒකල වාදනය-(කනිෂ්ඨ)**/පිරිමි/තබ්ලා/ නියමිත තාලය - ත්‍රිතාල්

( **A.2.38 , A.2.39** ශීර්ෂයන්ට සහභාගි විය හැක්කේ ජාත්‍යන්තර පාසල්, රජයේ නොවන පාසල් සහ එවැනි වෙනත් පුද්ගලික පාසල්වලට පමණි.)

**ඉහත A.2.38 සහ A.2.39 ශීර්ෂයන්ට අදාළ පොදු කොන්දේසි**

- මධ්‍යලය වාදනයක් විය යුතු ය.
- වයනු ලබන ලෙහෙරාවකට අනුගත විය යුතු ය.
- ශාස්ත්‍රීය තබ්ලා වාදන අංග හා ප්‍රබන්ධ සාම්ප්‍රදායික,පිළිවෙලින් ඉදිරිපත් කළ යුතු ය.
- නිවැරදි වාදන ඉරියව්, හස්ත සාධන සහ නාද නිෂ්පත්තිය පිළිබඳ අවධානය යොමු කළ යුතු වේ.
- කාලය අවම විනාඩි 03කි. උපරිම විනාඩි 04 කි.
- සහභාගි විය හැකි සංඛ්‍යාව - තරගකරු හැර, ස්වර වාදනය සඳහා සහාය වාදකයින් උපරිම 02 කි.

## B. ජොෂ්ඨ - 1 කොටස (9 -11 ශ්‍රේණි සඳහා)

**B.1.25** ඒකල ගායනය-(**ජොෂ්ඨ-1**)/ගැහැණු/රාගධාරි/ යමන් රාගය

**B.1.26** ඒකල ගායනය-(**ජොෂ්ඨ-1**)/පිරිමි/රාගධාරි/ යමන් රාගය

**(B.1.25 , B.1.26 ශීර්ෂයන්ට සහභාගී විය හැක්කේ ශිෂ්‍ය සංඛ්‍යාව 300 ට අඩු පාසල් සඳහා පමණි.)**

❖ **මෙම තරග ශීර්ෂ සඳහා තබ්ලාවෙන් සහාය වාදනයට සහභාගී විය යුත්තේ පාසල් සිසු-සිසුවියන් පමණි.**

**B.1.27** ඒකල ගායනය-(**ජොෂ්ඨ-1**)/ගැහැණු/රාගධාරි/ භෛරවී රාගය

**B.1.28** ඒකල ගායනය-(**ජොෂ්ඨ-1**)/පිරිමි/රාගධාරි/ භෛරවී රාගය

**(B.1.27 , B.1.28 ශීර්ෂයන්ට සහභාගී විය හැක්කේ ශිෂ්‍ය සංඛ්‍යාව 301 - 1000 ත් පාසල් සඳහා පමණි.)**

❖ **මෙම තරග ශීර්ෂ සඳහා තබ්ලාවෙන් සහාය වාදනයට සහභාගී විය යුත්තේ පාසල් සිසු-සිසුවියන් පමණි.**

**B.1.29** ඒකල ගායනය-(**ජොෂ්ඨ-1**)/ගැහැණු/රාගධාරි/බිලාවල් හෝ අල්හෛයා බිලාවල් රාගය

**B.1.30** ඒකල ගායනය (**ජොෂ්ඨ-1**)/පිරිමි/රාගධාරි/ බිලාවල් හෝ අල්හෛයා බිලාවල් රාගය

**(B.1.29 , B.1.30 ශීර්ෂයන්ට සහභාගී විය හැක්කේ ශිෂ්‍ය සංඛ්‍යාව 1001 ට වැඩි පාසල් සඳහා පමණි.)**

❖ **මෙම තරග ශීර්ෂ සඳහා තබ්ලාවෙන් සහාය වාදනයට සහභාගී විය යුත්තේ පාසල් සිසු-සිසුවියන් පමණි.**

**B.1.25 සිට B.1.30 දක්වා ශිර්ෂයන්ට අදාළ පොදු කොන්දේසි**

- හින්දි බසින් රචිත ඛ්‍යාල් ශෛලියේ මධ්‍යලය ගීතයක් විය යුතුය.
- සාම්ප්‍රදායික ශාස්ත්‍රීය ඒකල ගායන අංගවලින් පෝෂිත විය යුතු ය.
- වෙනත් ගායන ශෛලීන් මිශ්‍ර කළ නොහැකිය.
- කාලය අවම විනාඩි 05 කි.උපරිම විනාඩි 06 කි.
- සහභාගී විය හැකි සංඛ්‍යාව - තරගකරු හැර සහාය වාදකයින් උපරිම සංඛ්‍යාව 04 කි.
- සාම්ප්‍රදායිකව භාවිත කරනු ලබන ශ්‍රැති වාද්‍ය භාණ්ඩ මෙන්ම ඉලෙක්ට්‍රොනික් තාම්පුරාවද යොදා ගත හැකිය. අවශ්‍යනම් ස්වරමණ්ඩලයක් ද යොදාගත හැකි ය.
- ප්‍රධාන තරගකරුට අවශ්‍ය වන්නේනම් තාම්පුරාව හෝ ස්වරමණ්ඩලය වයමින් ගැයීමට හැකි ය.
- **තබ්ලාවෙන් සහාය වාදනයට සහභාගී විය යුත්තේ පාසල් සිසු-සිසුවියන් පමණි.**

**B.1.31** ඒකල ගායනය -(**ජොෂ්ඨ-1**)/ගැහැණු / වංග ගීත - (Eso Shyamolo Sundaro)

**B.1.32** ඒකල ගායනය-( **ජොෂ්ඨ-1**) /පිරිමි /වංග ගීත - ( jodi tor dak shune keu na ashe )

**(B.1.31 , B.1.32 ශීර්ෂයන්ට සහභාගී විය හැක්කේ ශිෂ්‍ය සංඛ්‍යාව 300 ට අඩු පාසල් සඳහා පමණි.)**

**B.1.33** ඒකල ගායනය -(**ජොෂ්ඨ-1**)/ගැහැණු / භජන් - (Thumak Chalat Ramchandra)

**B.1.34** ඒකල ගායනය-( **ජොෂ්ඨ-1**) /පිරිමි / කව්වාලි - (hame to loot liya milke husn walon ne)

**(B.1.33 , B.1.34 ශීර්ෂයන්ට සහභාගී විය හැක්කේ ශිෂ්‍ය සංඛ්‍යාව 301 - 1000 ත් පාසල් සඳහා පමණි.)**

**B.1.31 සිට B.1.34 දක්වා ශිර්ෂයන්ට අදාළ පොදු කොන්දේසි**

- ගායන විශේෂයට අදාළව දී ඇති ගීතය ඉදිරිපත් කළ යුතු ය.
- අදාළ ගායන විශේෂයට අනුකූල ගායන හා වාදන අංගවලින් පෝෂිත විය යුතු ය.
- කාලය - ගීතයට ගතවන කාලය ලෙස සලකන්න.
- සහභාගී විය හැකි සංඛ්‍යාව - තරගකරු හැර සහාය වාදකයින් උපරිම සංඛ්‍යාව 05 කි.
- ගී ශෛලිය,ආකෘතිය රැකෙන පරිදි, මුල් නාදමාලාව අනුව ගායනය කළ යුතු ය.
- **ගීතයේ මුල් නාදමාලාවට ඇතුළත් නොවන කිසිදු අලංකාර ප්‍රයෝගයක් භාවිත නොකළ යුතු ය.**

**B.1.35** ඒකල ගායනය-(**ජ්‍යෙෂ්ඨ-1**)/ගැහැණු/ නූර්ති (දුටුවාද ස්වාමී මගෙ ස්වාමී - රාමායනය නූර්තිය)

**B.1.36** ඒකල ගායනය-(**ජ්‍යෙෂ්ඨ-1**)/පිරිමි/ නාඩගම් (උත්තමවන් ලොව පතලා - ජොහානා නාඩගම)

**(B.1.35 , B.1.36 ශීර්ෂයන්ට සහභාගී විය හැක්කේ ශිෂ්‍ය සංඛ්‍යාව 1001 ට වැඩි පාසල් සඳහා පමණි.)**

<u>ඉහත **B.1.35** සහ **B.1.36** ශීර්ෂයන්ට අදාළ පොදු කොන්දේසි</u>

- රංග ශෛලීන්ට අදාළව දී ඇති ගීතය ඉදිරිපත් කළ යුතු ය.
- අදාළ ගීය අයත් ශෛලියට අනුකූලව ගායන,වාදන,අංග වලින් පෝෂිත විය යුතු ය.
- ගී ශෛලිය,ආකෘතිය රැකෙන පරිදි, මුල් නාදමාලාව අනුව ගායනය කළ යුතු ය.
- කාලය - ගීතයට අදාළ කාලය ලෙස සලකන්න.
- සහභාගීවිය හැකි සංඛ්‍යාව - තරගකරු හැර සහාය වාදකයින් උපරිම සංඛ්‍යාව 05 කි.
- ගීතයේ මුල් නාදමාලාවට ඇතුළත් නොවන කිසිදු අලංකාර ප්‍රයෝගයක් භාවිත නොකළ යුතු ය.

**B.1.37** **සමූහ ගායනය (ජ්‍යෙෂ්ඨ-1) ගැහැණු / සිංහල චිත්‍රපට ගී "රොන් සොයා පියඹන සමනළියක සේ " ගීතය (චිත්‍රපටිය - ආවා සොයා ආදරේ)**

**B.1.38** **සමූහ ගායනය (ජ්‍යෙෂ්ඨ-1) පිරිමි / සිංහල චිත්‍රපට ගී "රන් දෙවොලෙන් බැස එන දෙයියෝ" ගීතය (චිත්‍රපටිය - ආදර හසුන)**

**B.1.39** **සමූහ ගායනය (ජ්‍යෙෂ්ඨ-1) මිශ්‍ර / සිංහල චිත්‍රපට ගී "මං ප්‍රාර්ථනා ආශාවෝ " ගීතය (චිත්‍රපටිය - ළසඳා)**

**(B.1.37 සිට B.1.39 ශීර්ෂයන්ට සහභාගී විය හැක්කේ ශිෂ්‍ය සංඛ්‍යාව 300 ට අඩු පාසල් සඳහා පමණි.)**

**B.1.40** **සමූහ ගායනය (ජ්‍යෙෂ්ඨ-1) ගැහැණු / හිංදි චිත්‍රපට ගී** "Aaja Aai Bahar Dil Hai Bekarar" **ගීතය (චිත්‍රපටිය -** Rajkumar **)**

**B.1.41** **සමූහ ගායනය (ජ්‍යෙෂ්ඨ-1) පිරිමි / හිංදි චිත්‍රපට ගී** " Jiske Sapne Hame Roj Aate Rahe " **ගීතය (චිත්‍රපටිය - Geeth)**

**B.1.42** **සමූහ ගායනය (ජ්‍යෙෂ්ඨ-1) මිශ්‍ර / හිංදි චිත්‍රපට ගී** " Jo Wada Kiya Woh Nibhana Padega " **ගීතය (චිත්‍රපටිය -** Taj Mahal**)**

**(B.1.40 සිට B.1.42 ශීර්ෂයන්ට සහභාගී විය හැක්කේ ශිෂ්‍ය සංඛ්‍යාව 301 -1000 ත් පාසල් සඳහා පමණි.)**

**B.1.43** **සමූහ ගායනය (ජ්‍යෙෂ්ඨ-1) ගැහැණු / දමිළ චිත්‍රපට ගී ( " Ennadi sellakanne" ) (චිත්‍රපටිය -** Thenmazhai**)**

**B.1.44** **සමූහ ගායනය (ජ්‍යෙෂ්ඨ-1) පිරිමි / දමිළ චිත්‍රපට ගී (" Ennarumai Kadhalikku Vennilaave ") (චිත්‍රපටිය -** Ellorum Innaattu Mannar**)**

**B.1.45** **සමූහ ගායනය (ජ්‍යෙෂ්ඨ-1) මිශ්‍ර / දමිළ චිත්‍රපට ගී ( " aadatha manamum aaduthe " ) (චිත්‍රපටිය -** kalathur kannamma**)**

**(B.1.43 සිට B.1.45 ශීර්ෂයන්ට සහභාගී විය හැක්කේ ශිෂ්‍ය සංඛ්‍යාව 1001 ට වැඩි පාසල් සඳහා පමණි.)**

**B.1. 37 සිට B.1.45 දක්වා ශීර්ෂයන්ට අදාළ පොදු කොන්දේසි**

- එක් පාසලකට ඉදිරිපත් විය හැක්කේ මින් එක් තරග ශීර්ෂයකට පමණි.
- තරග ශීර්ෂය යටතේ නම් කර ඇති චිත්‍රපට ගීතයේ පෙරවාදන , අතුරුවාදන සහ ගීතයේ තනුව වෙනස් නොකළ යුතු ය. සමූහ ගායන අංගවලින් විචිත්‍රවත් කළ හැකි ය.
- ගායනයට හානි නොවන සේ ප්‍රකාශනාත්මක චලන යොදා විචිත්‍රවත් කළ හැකි ය.
- කාලය ගීතයට අදාළ කාලය ලෙස සලකන්න .
- සහභාගී විය හැකි සංඛ්‍යාව වාදක මණ්ඩලය හැර අවමය 18 කි. වාදක මණ්ඩලය සමග උපරිම 25 කි.
- වාදක මණ්ඩලයට ගායනයට සහභාගී විය නොහැකි ය.
- **ගීතයේ මුල් නාදමාලාවට ඇතුළත් නොවන කිසිදු අලංකාර ප්‍රයෝගයක් භාවිත නොකළ යුතු ය.**

**B.2.40** ඒකල වාදනය - ( **ඡොෂ්ඨ-1**)/ගැහැණු/රාගධාරී/වයලීනය/නියමිත රාගය - හෛරවී රාගය

**B.2.41** ඒකල වාදනය - (**ඡොෂ්ඨ-1**)/පිරිමි/රාගධාරී/වයලීනය/නියමිත රාගය - හෛරවී රාගය

**B.2.42** ඒකල වාදනය - ( **ඡොෂ්ඨ-1**)/ගැහැණු/රාගධාරී/එස්රාජ්/නියමිත රාගය - කාෆි රාගය

**B.2.43** ඒකල වාදනය - ( **ඡොෂ්ඨ-1**)/පිරිමි/රාගධාරී/එස්රාජ්/නියමිත රාගය - කාෆි රාගය

**B.2.44** ඒකල වාදනය - ( **ඡොෂ්ඨ-1**)/ගැහැණු/රාගධාරී/බටනලා/නියමිත රාගය - භූපාලි රාගය

**B.2.45** ඒකල වාදනය - ( **ඡොෂ්ඨ-1**)/පිරිමි/රාගධාරී/බටනලා/නියමිත රාගය: - භූපාලි රාගය

**B.2.46** ඒකල වාදනය - ( **ඡොෂ්ඨ-1**)/ගැහැණු/රාගධාරී/ සිතාර් /නියමිත රාගය - භිම්පලාසි රාගය

**B.2.47** ඒකල වාදනය - ( **ඡොෂ්ඨ-1**)/පිරිමි/රාගධාරී/ සිතාර් /නියමිත රාගය - භිම්පලාසි රාගය

**B.2.48** ඒකල වාදනය - ( **ඡොෂ්ඨ-1**)/ගැහැණු/රාගධාරී/ දිල්රුබා /නියමිත රාගය - බිලාවල්/අල්හෛයා බිලාවල් රාගය

**B.2.49** ඒකල වාදනය - ( **ඡොෂ්ඨ-1**)/පිරිමි/රාගධාරී/ දිල්රුබා /නියමිත රාගය - බිලාවල්/අල්හෛයා බිලාවල් රාගය

**B.2.40 සිට B.2.49 දක්වා ශීර්ෂයන්ට අදාළ පොදු කොන්දේසි**

- මධ්‍යලය ශාස්ත්‍රීය වාදනයක් විය යුතු ය.
- සාම්ප්‍රදායික ඒකල ශාස්ත්‍රීය වාදන අංගවලින් පෝෂිත විය යුතු ය.
- නිවැරදි ඉරියව් සහ හස්ත සාධන පිළිබඳ අවධානය යොමු කළ යුතු වේ.
- කාලය - අවම විනාඩි 05කි. උපරිම විනාඩි 06 කි.
- සහභාගි විය හැකි සංඛ්‍යාව - තරගකරු හැර සහාය වාදකයින් උපරිම 03 කි.
- ඉලෙක්ට්‍රොනික තාම්පුරාව යොදා ගත හැකි ය.

**B.2.50** ඒකල වාදනය-( **ඡොෂ්ඨ-1**)/ගැහැණු/රාගධාරි ධූන්/ගිටාර් - ආශ්‍රිත රාගය - ඛමාජ් රාගය

**B.2.51** ඒකල වාදනය-( **ඡොෂ්ඨ-1**)/පිරිමි/රාගධාරි ධූන් /ගිටාර් - ආශ්‍රිත රාගය - දේස් රාගය

